සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

ව්‍යාපාර අධ්‍යයනය - I | **32 S I** | කාලය: පැය දෙකයි

විභාග අංකය: ....

උපදෙස් :-
- සියළු ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක්වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්න 05 ඉදිරියෙන් ඇති තිත් ඉරමත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක්වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාල තිත් ඉරමත ලියන්න.

01. මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාර ''වුවමනා'' ලෙස හැඳින්වේ. වුවමනාවක ලක්‍ෂණයක් නොවන්නේ,

1) අසීමිත වීම.
2) විවිධ වීම.
3) පුද්ගල බද්ධ වීම.
4) ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළ නොහැකි වීම.
5) සමාජ බලවේග මඟින් වෙනස් කළ හැකි වීම. (.............)

02. ඇඳුම් මැසීමේ ව්‍යාපාරික කටයුත්තක නියැලි සිටි සඳමිණි, කොරෝනා වසංගතයේ බලපෑමක් සමඟ එම ව්‍යාපාර කටයුතු තාවකාලිකව නවතා ''මුව ආවරණ'' මැසීමට පටන් ගත්තාය. ව්‍යාපාර වර්ගීකරණය අනුව ''මුව ආවරණ'' මැසීමේ කටයුතු අයත් වන්නේ මින් කුමන වර්ගයටද,

1) ප්‍රාථමික
2) ද්විතීයික
3) තෘතියික
4) පොදු
5) සේවා (.............)

03. තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදු වී ඇති ප්‍රවණතා රාශියකි. එවැනි ප්‍රවණතාවයක් ලෙස සැලකිය නොහැක්කේ,

i. පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම.
ii. ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳ සැලකිලිමත් වීම.
ii. ගෝලීයකරණය ව්‍යාප්ත වීම.
iv. විද්‍යුත් ව්‍යාපාර බිහිවීම.
v. කාර්මික විප්ලවය (.............)

04. මුදල් භාවිතයේ ක්‍රමික විකාශනයේ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

A - ලෝහ වර්ග භාවිතය.

B - ද්‍රව්‍ය භාවිතය.

C - ලෝහ කාසි මුදල් භාවිතය.

D - බැංකු මුදල් භාවිතය.

E - විද්‍යුත් මුදල් භාවිතය.

F - කාසි හා නෝට්ටු භාවිතය.

මේවා නිවැරදි අනුපිළිවෙලට පෙළ ගස්වා ඇති වරණය කුමක්ද?

i. B, C, A, F, D, E ii. B, A, F, C, D, E iii. B, C, A, D, F, E

iv. B, A, C, D, F, E v. B, A, C, F, D, E (.............)

05. එක් එක් පාර්ශ්වයන් වෙත ව්‍යාපාරයක් ඉටු කළයුතු සමාජ වගකීම් කිහිපයක් පහත දැක්වේ.

A - සාධාරණ වීම. B - අපද්‍රව්‍ය කළමනාකරණය.

C - සමානාත්මතාව D - හානි අවම කිරීම.

E - ප්‍රජා සත්කාර සේවා F - ආර්ථික ප්‍රතිලාභ අත්කර දීම.

G - හරිත නිෂ්පාදිත ඉදිරිපත් කිරීම. H - සෞඛ්‍ය හා ආරක්ෂක පහසුකම්

මේ අතරින් සමාජය හා ගනුදෙනුකරුවන්ට අදාල සමාජ වගකීම් වෙන වෙනම දැක්වෙන වරණය කුමක්ද?

සමාජය	ගනුදෙනු කරුවන්
1. A, B, E	C, D
2. B, D, E	C, F
3. B, E, G	A, D
4. C, E, G	A, H
5. B, G, H	A, C

(..............)

06. රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය සම්බන්ධව ඉදිරිපත් කළ ප්‍රකාශ 02ක් පහත දැක්වේ.

A - රජය වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයයි.

B - ණය ලබා දෙන ක්ෂේත්‍ර නිර්දේශ කිරීම ප්‍රමාණාත්මක ණය සීමා පැනවීමකි.

ඉහත ප්‍රකාශ 02 අතරින්

1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. 2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

3) A, B ප්‍රකාශ දෙකම අසත්‍ය වේ. 4) A, B ප්‍රකාශ දෙකම සත්‍ය වේ.

5) A, B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර B මඟින් A තව දුරටත් තහවුරු කෙරේ. (.............)

07. රජය විසින් පනවනු ලබන බදු වර්ග කිහිපයක් පහත දැක්වේ.

A - උපයන විට බදු B - ආනයන තීරු බදු

C - නිෂ්පාදන බදු D - සමාගම් බදු

E - එකතු කළ අගය මත බදු F - ප්‍රාග්ධන ලාභ බදු

G - විදුලි සංදේශ බදු H - පුද්ගල ආදායම් බදු

ඉහත බදු අතරින් ඍජු බදු පමණක් ඇතුළත් වන්නේ,

1) B, C, E, G හිය 2) A, D, G, H හිය 3) D, F, G, H හිය

4) A, D, F, H හිය 5) B, C, E, H හිය (.............)

08. මුළු ප්‍රාග්ධනයෙන් 51% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් රජය හෝ රජයේ අනුබද්ධිත ආයතනයකට අයිති, සමාගම් පනතට අනුවලියාපදිංචි කොට පවත්වා ගෙන යන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

1) රාජ්‍ය සංස්ථා
2) රාජ්‍ය දෙපාර්තමේන්තුව.
3) හවුල් ව්‍යාපාර
4) රාජ්‍ය සමාගම්.
5) පොදු සමාගම් (.............)

09. හරිත ව්‍යවසායකත්වයේ ප්‍රධාන අරමුණ වන්නේ,

1) නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීම යි.
2) වෙළෙඳ පොළ ප්‍රසාරණය යි.
3) ජීවන තත්ත්වය උසස් කරලීම යි.
4) ස්වභාවික පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කිරීම යි.
5) අපතේ යන සම්පත් පූර්ණ උපයෝජනයට ලක් කිරීම යි. (.............)

10. ඉෂානි බතික් සාරි නිෂ්පාදනයේ යෙදී සිටින්නකි. ඇය විසින් නිම කරන ලද සාරි තොගයෙන් එක් සාරියකට රු. 4500ක් ලෙස මිල නියම කර තිබුණි. මෙසේ මිල නියම කිරීමෙන් මුදලෙන් ඉටුකරනු ලබන්නේ කුමන කාර්යයක්ද?

1) විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.
2) වටිනාකම මැනීමේ මිනුම් දන්ඩක් වීම.
3) විලම්භිත ගෙවුම් මාධ්‍යයක් වීම.
4) වටිනාකමේ සන්නිධියක් වීම.
5) අතරමැදියෙකු ලෙස කටයුතු කිරීම. (.............)

11. ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණයට අනුව වර්ගීකරණ පද නම් x තීරුවේදී ඊට අයත් මූල්‍ය ආයතන y තීරුවේ ද දැක්වේ.

X		Y
A.	බැංකු අංශය.	1. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
B.	විශේෂිත මූල්‍ය ආයතන	2. බලපත්‍රලාභී මුදල් සාමගම්
C.	ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන	3. බලපත්‍රලාභී විශේෂිත බැංකු
D.	තැන්පත් භාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන.	4. රක්ෂණ සමාගම්.

x තීරුවේ වර්ගීකරණයන් y තීරුවේ දැක්වෙන මූල්‍ය ආයතන සමඟ නිවැරදිව ගැලපූ විට පිළිතුරු වන්නේ,

1) A - 1, B - 3, C - 4, D - 2   2) A - 3, B - 4, C - 1, D - 2   3) A - 1, B - 2, C - 4, D - 2
4) A - 3, B - 1, C - 4, D - 2   5) A - 4, B - 3, C - 1, D - 2 (.............)

12. චෙක්පතක චුම්භය අක්ෂර හැඳුනුම් තීරයෙහි ඇතුලත් තොරතුරු නිවැරදිව අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

1) බැංකුවේ අංකය / චෙක්පත් අංකය / ශාඛාවේ අංකය / ගිණුම් අංකය.
2) බැංකුවේ අංකය / ශාඛාවේ අංකය / චෙක්පත් අංකය / ගිණුම් අංකය.
3) චෙක්පත් අංකය / බැංකුවේ අංකය/ ශාඛාවේ අංකය / ගිණුම් අංකය.
4) චෙක්පත් අංකය / ගිණුම් අංකය / බැංකුවේ අංකය / ශාඛාවේ අංකය.
5) චෙක්පත් අංකය / ගිණුම් අංකය / ශාඛාවේ අංකය / බැංකුවේ අංකය. (.............)

13. රක්ෂණ සමාගමක් තමන් වෙත රක්ෂණය කර ඇති රක්ෂිතයන්ගේ රක්ෂණ ඔප්පු වෙනත් රක්ෂණ සමාගමක රක්ෂණයට යටත් කිරීම හැඳින්වෙන්නේ.

1) ප්‍රාරක්ෂණය වශයෙනි.
2) ද්විත්ව රක්ෂණය වශයෙනි.
3) ප්‍රති රක්ෂණය වශයෙනි.
4) අධි රක්ෂණය වශයෙනි.
5) ඌන රක්ෂණය වශයෙනි. (............)

14. ABCD යන අක්ෂරවලින් අන්තර්ජාතික වෙළඳාමේදී භාවිතා වන ලියවිලි කිහිපයක්ද 1, 2, 3, 4 යන අංක වලින් ඒවායේ වැදගත්කම ද දැක්වේ.

ලියවිලි	වැදගත්කම
A - හානි රක්ෂණ ලිපිය	1. අපනයන භාණ්ඩවල වටිනාකම අපනයකරුට ලැබීම තහවුරු වේ.
B - සනීපාරක්ෂණ සහතිකය	2. භාණ්ඩ නිෂ්පාදනය කළ රට තීරණය කිරීමට.
C - ප්‍රභවස්ථාන සහතිකය	3. දෘෂ්‍ය නෞභාරපතක් වෙනුවට පාරිශුද්ධ නෞභාරපතක් ලබා ගැනීමට ඉවහල් වේ.
D - ණයවර ලිපිය	4. ඇතැම් කෘෂි නිෂ්පාදනවල පරිභෝජන යෝග්‍යතාව සහතික කරයි.

ඉහත තීරු දෙක ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

1) A - 3, B - 4, C - 2, D - 1 2) A - 2, B - 3, C - 1, D - 4 3) A - 3, B - 4, C - 1, D - 2
4) A - 3, B - 1, C - 2, D - 4 5) A - 1, B - 2, C - 3, D - 4 (.............)

15. ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලට ගැනීමේදී හෝ විකිණීමේ දී එම ගනුදෙනු තම පෞද්ගලික නමින් සිදුකරනු ලබන නියෝජිතයා හඳුන්වන්නේ,

1) කොමිස් නියෝජිතයා ලෙසය. 2) තැරැව්කරු ලෙසය.
3) සාධ්‍යකයා ලෙසය. 4) කැපකරු නියෝජිතයා ලෙසය.
5) වෙන්දේසිකරු ලෙසය. (.............)

16. කළමනාකරණ මට්ටම් හා ඒ ඒ මට්ටමේ දී කළමනාකරුවන් සතු විය යුතු කුසලතා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

I. අග්‍ර කළමනාකරුවන්ට සංකල්පනාත්මක හා මානව කුසලතා වැඩි වශයෙන් අවශ්‍ය වේ.
II. පළමු පෙල කළමනාකරුවන්ට තාක්ෂණික කුසලතා වැඩි වශයෙන් අවශ්‍ය වේ.
III. මධ්‍ය මට්ටමේ කළමනාකරුවන්ට සංකල්පනාත්මක කුසලතා වැඩි වශයෙන් අවශ්‍ය වේ.
IV. සෑම මට්ටමේ කළමනාකාරුවකුට ම තාක්ෂණික කුසලතා එකසේ අවශ්‍ය වේ.
V. සෑම මට්ටමේ කළමනාකරුවෙකුට ම මානව කුසලතා එකසේ අවශ්‍ය වේ.

නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) I හා III පමණි. 2) II හා III පමණි. 3) I හා IV පමණි.
4) II හා V පමණි. 5) III හා V පමණි. (.............)

17. පළතුරු අපනයනය කරන සීමාසහිත ලක් ෆෲට්ස් සහ සමාගම මෑතක සිට විදේශයන්ගේ ඉහළ ඉල්ලුමක් ඇති ඩ්‍රැගන් ෆෲට්ස් මෙතෙක් අපනයනය කරමින් සිටි පැපොල් වෙනුවට අපනයනය කිරීම සුදුසුදැයි අධ්‍යක්ෂක මණ්ඩලය කරුණු විමර්ශණය කරයි.

මෙය තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කුමන පියවරට අයත් වේද?

1) ගැටලු හඳුනා ගැනීම. 2) ගැටලුව විශ්ලේෂණය 3) විකල්ප විශ්ලේෂණය.
4) හොඳම විකල්පය තේරීම. 5) ඇගයීම හා ප්‍රතිපෝෂණය. (.............)

18. කම්හල් පිරියත සැලසුම් වර්ගයක් නොවන්නේ කුමක්ද?
    1) ක්‍රියාවලි 2) ප්‍රවාහ 3) නිෂ්පාදිත
    4) ස්ථාවර ස්ථානිය 5) කුටි (.............)

19. තොග පවත්වා ගෙන යාමෙන් දැරීමට සිදුවන පිරිවැය අනවශ්‍ය වියදමක් බවත් එම නිසා අවශ්‍ය අවස්ථාවේ දී අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගන්නා බවත් නිෂ්පාදකයෙකු පවසයි. මොහු අනුගමනය කරනු ලබන තොග පාලන ක්‍රමය වන්නේ,
    1) ද්විත්ව භාජන ක්‍රමය යි.
    2) JIT ක්‍රමය යි.
    3) ABC විශ්ලේෂණය යි.
    4) පරිගණක වැඩ සටහන් ක්‍රමයයි.
    5) අඛණ්ඩ තොග පවත්වා ගැනීමේ ක්‍රමය යි. (.............)

20. ගනුදෙනුකරුගේ දෘෂ්ටියෙන් අලෙවිකරණ මිශ්‍රයට අයත් විචල්‍යයන් වන්නේ,
    1) නිෂ්පාදිතය / සන්නම / ගෙවීමේ ක්‍රම / ප්‍රවර්ධනය
    2) නිෂ්පාදිතය / මිල / ස්ථානය / ප්‍රවර්ධනය
    3) ක්‍රියාවලිය / පිරිවැය / පහසුව / ස්ථානය
    4) ක්‍රියාවලිය / භෞතික වටපිටාව/ පහසුව
    5) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා / පිරිවැය / පහසුව / සන්නිවේදනය. (.............)

21. නිෂ්පාදිතයක විකුණුම් ඉහළ යමින් ලාභාන්තිකයක් ද දක්නට ලැබෙන භාණ්ඩයක ජීවන චක්‍රයට අයත් අදියර වන්නේ,
    1) භාණ්ඩ සංවර්ධන අදියර 2) පරිණත අදියර
    3) හඳුන්වාදීමේ අදියර 4) පිරිහීමේ අදියර
    5) වර්ධන අදියර (.............)

22. මූල්‍ය කළමනාකරණයේදී කළමනාකරුවන් ආයෝජන තීරණ මෙන්ම මූල්‍ය තීරණ ද ගනු ලබයි. මූල්‍ය කළමණාකරුවන් ගනු ලබන දිගුකාලීන ආයෝජන තීරණයක් වන්නේ,
    1) වෙළඳ තොග පිළිබඳව 2) ණය ගැතියන් පිලිබඳව
    3) වෙළෙඳ ණය හිමියන් පිළිබඳව 4) ව්‍යාපාර විවිධාංගිකරණය පිළිබඳව
    5) ලාභාංශ පිළිබඳව (.............)

23. අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ග දැක්වෙන කාණ්ඩය තෝරන්න.
    1) කුලීපිට ගැනුම් / කල් බදු / රඳවාගත් ලාභ / ක්ෂය වෙන් කිරීම්
    2) ක්ෂය වෙන් කිරීම් / කල් බදු / රඳවාගත් ලාභ / උකස්කර
    3) රඳවාගත් ලාභ / ණය වෙන් කිරීම් / අතිරික්ත වත්කම් විකිණීම / කාරක ප්‍රාග්ධන දැඩිව පාලනය කිරීම.
    4) ක්ෂය වෙන් කිරීම් / කල්බදු / අතිරික්ත වත්කම් විකිණීම / රඳවාගත් ලාභ
    5) රඳවාගත් ලාභ / කුලිපිට ගැණුම් / උකස් කර / කල් බදු (.............)

24. ව්‍යාපාරයක කෙටි කාලීන නුබුන්වත්භාවය හඳුනා ගැනීමට භාවිතා කරන අනුපාතය වන්නේ,
    1) ලාභ දායිත්ව අනුපාත 2) ක්‍රියාකාරී අනුපාත
    3) ද්‍රවශීලතා අනුපාත 4) ණය අනුපාතය
    5) හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය. (.............)

25. පුහුණුව හා සංවර්ධනය පිළිබඳව වලංගු නොවන ප්‍රකාශය වන්නේ,
   1) පුහුණුව කෙටි කාලීන වැඩසටහනක් වන අතර සංවර්ධනය දිගු කාලීන වැඩසටහනකි.
   2) පුහුණුව, අවශ්‍ය දැනුම හා කුසලතා ලබා දෙන අතර සංවර්ධනය මනෝභාවාත්මක කුසලතා ලබාදෙයි.
   3) පුහුණුව සේවකයින් සඳහා වන අතර සංවර්ධනය, සේවායෝජකයන් සඳහා ලබා දෙයි.
   4) පුහුණුව, කළමණාකරණ නොවන මෙහෙයුම් සේවකයන්ට වන අතර සංවර්ධනය, කළමණාකරණ සේවයකයන් වෙනුවෙනි.
   5) පුහුණුව කාලීන (වර්තමාන) අවශ්‍යතා ඉටු කරන අතර සංවර්ධනය අනාගත අවශ්‍යතා ඉටු කිරීමේ පෙර ක්‍රියාවලියකි. (.............)

26. ආයතනයක සේවක වැටුප් තීරණය කිරීමේදී සලකා බලනු ලබන සාධක අතරට එක් කළ නොහැකි සාධකයකි.
   1) රටේ පවතින ජීවන මට්ටම
   2) රජයේ කම්කරු නීති හා රෙගුලාසි
   3) ශ්‍රමයට ඇති ඉල්ලුම හා සැපයුම
   4) සේවකයින් අයත්වන ජාතිය හා ආගම
   5) රැකියාවේ පවතින අවදානම්කාරී තත්වය. (.............)

27. කාර්යාල ස්වයංක්‍රියා පද්ධති (Office Automation System) ව්‍යාපාරයක දත්ත සේවකයන්ගේ සහ කාර්යාල වල ඵලදායකත්වය වැඩි කිරීම සඳහා භාවිතා කරන තොරතුරු පද්ධති වේ. මෙම පද්ධතිය සඳහා උදාහරණයක් නොවන්නේ,
   1) පරිගණක ආශ්‍රිත සැලසුම්කරණ පද්ධති (Computer Aided Designing system)
   2) දත්ත සමුදාය පද්ධති (Date Base System)
   3) වදන් සැකසුම් පද්ධති (Word processing System)
   4) පරිගණක අක්ෂර සංයෝජන / ප්‍රකාශන පද්ධති (Desktop publishing System)
   5) විද්‍යුත් තැපැල් මෙහෙයුම් පද්ධති (Electronic Mail System) (.............)

28. ව්‍යාපාර ආයතනයක සිටින විවිධ වර්ගයේ සේවකයන් සමූහයක් පහතින් දැක්වේ.
   - මානව සම්පත් කළමණාකරු - සුමනසේකර මහතා
   - මුදල් අධ්‍යක්ෂ - ගාල්ලගේ මහතා
   - පිරිවැය ගණකාධිකාරිය - නිරෝෂනි මෙනවිය
   - ගිණුම් ලිපිකරු - චමින්ද මහතා
   - කළමණාකරන අධ්‍යක්ෂ - සෙබෙස්තියන් මහතා
   - ගබඩා භාරකරු - සුනිමල් මහතා

   ඉහත සේවකයින් අතර සිටින දත්ත සේවකයින් වන්නේ.
   1) සුමනසේකර මහතා, ගාල්ලගේ මහතා සහ සෙබෙස්තියන් මහතා
   2) ගාල්ලගේ මහතා, සෙබෙස්තියන් මහතා හා නිරෝෂනී මෙනෙවිය
   3) සුනිමල් මහතා, නිරෝෂනී මෙනවිය හා චමින්ද මහතාය
   4) ගාල්ලගේ මහතා, නිරෝෂනී මෙනවිය හා චමින්ද මහතාය
   5) සෙබෙස්තියන් මහතා, සුනිමල් මහතා හා සුමනසේකර මහතාය (.............)

29. ව්‍යාපාර සැලැස්ම පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
   1) පවතින ව්‍යාපාරය හෝ නව ව්‍යාපාරයක් පිළිබඳ ඇල්ම ඇති පාර්ශවයන්ට හෝ මූල්‍ය සපයන්නන්ටව්‍යාපාරයක් අනාගත වැඩ පිළිවෙල පිළිබඳ ඉදිරිපත් කරන ලිඛිත ලේඛන ව්‍යාපාර සැලැස්මයි.
   2) ව්‍යාපාර අයිතිකරුවන්ට හෝ ඇල්මක් දක්වන පාර්ශවයන්ට ව්‍යාපාරය පිළිබඳ පොරොන්දු හා විශ්වාසයන් අලෙවිකරණ ලියවිල්ල ව්‍යාපාර සැලැස්මයි.
   3. ව්‍යාපාරයක දැක්ම, මෙහෙවර, අරමුණු, පරමාර්ථ ආදිය දක්වමින් තම ව්‍යාපාර පිළිබඳව සාරාංශගතව ඉදිරිපත් කරනු ලබන ලියවිල්ල ව්‍යාපාර සැලැස්මයි.

4. කිසියම් ව්‍යාපාරයක සෑම අංශයකම ආර්ථික වලංගුතාව පිළිබඳව ලිඛිතව ඉදිරිපත් කරනු ලබන වැඩ සටහන ව්‍යාපාර සැලැස්මයි.
5. ව්‍යාපාරයක් පිළිබඳව ගෙවී ගිය වසර කීපයක ප්‍රගතිය දක්වමින් උනන්දු පාර්ශවයන් වෙත කරනු ලබන මූල්‍ය විශ්ලේෂණයක් ව්‍යාපාර සැලැස්ම වේ. (.............)

30. ව්‍යාපාර සැලැස්මක් සකස්කිරීමට ප්‍රථම ව්‍යාපාරිකයා විසින් පැහැදිලිවම අවබෝධ කරගත යුතු කරුණු ඇතුලත් කාණ්ඩය වන්නේ,
1) පැහැදිලි ඉම / ගනුදෙනුකරුවෝ / ඉලක්ක / බාහිර පරිසරය
2) පැහැදිලි ඉම / අභ්‍යන්තර පරිසරය / ඉලක්ක / අවශ්‍ය සම්පත්
3) සේවකයන් / බාහිර වාතාවරණය / අභ්‍යන්තර වතාවරණය /ඉලක්ක
4) පැහැදිලි ඉම / ගනුදෙනුකරුවෝ / ඉලක්ක / අවශ්‍ය මූල්‍ය සම්පත්
5) ඉලක්ක / අභ්‍යන්තර පරිසරය / බාහිර පරිසරය / අවශ්‍ය සම්පත් (.............)

- ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා ප්‍රශ්නවල හිස්තැන් වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

31. අ) සාධාරණවීම ව්‍යාපාරයක .... කෙරෙහි ඇති සමාජ වගකීමක් වන අතර සමානාත්මතාව .... කෙරෙහි ඇති සමාජ වගකීමකි.
ආ) 4 R සංකල්පයට අනුව, පරිසරයට මුදා හරින අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු කිරීම .... ලෙස හඳුන්වන අතර අපද්‍රව්‍ය වෙන්කොට වෙනත් භාණ්ඩයක් නිෂ්පාදනය කළ හැකි ද්‍රව්‍යයක් බවට පත් කිරීම .... ලෙස හඳුන්වයි.

32. අ) රාජ්‍ය සංස්ථා .... හෝ .... පනතක් යටතේ සංස්ථාපනය කළ හැකිය.
ආ) සෑම හවුල්කරුවෙකුම තමාගේ හා සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු සහා ප්‍රධානියෙකු වන බව .... තුළින් කියවේ.

33. අ) පොදු සමාගමක් කොටස් හෝ ණයකර සඳහා සහභාගී වන ලෙස මහජනතාවට ආරාධනය කරමින් සමාගම විසින් ප්‍රසිද්ධ කරන ලියවිල්ල .... ය.
ආ) තමා සතු කොටස් වෙළෙඳපොලේ අලෙවි කිරීමෙන් උපයා ගන්නා ආදායම .... ලෙස හැඳින්වෙන අතර සමාගම විසින් උපයනු ලබන ශුද්ධ ලාභයෙන් නිශ්චිත ප්‍රමාණයක් කොටස් හිමියන්ට ලබා දීම මගින් කොටස් හිමියන් උපයා ගන්නා ආදායම .... ලෙස හඳුන්වයි.

34. අ) ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මූලික කාර්ය භාරය වන්නේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන .... සහභාගි වීමත්, භාණ්ඩාගාර සුරැකුම්පත් සම්බන්ධයෙන් ....ගණුදෙනු කිරීමත්ය.
ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු දෙක වන්නේ.
1. .... හා 2. .... පවත්වාගෙන යාමයි.

35. අ) ආයතනයක මෙහෙයුම් කටයුතු සුමටව ගලායාම සඳහා සැලසුම්කරන ලද .... අත්‍යවශ්‍ය වේ. එවැනි පද්ධතියක මූලික ක්‍රියාවලි දෙකකි.
ආ) වෙළෙඳ පොළ පර්යේෂණ, අවශ්‍යතා සැලසුම් කිරීම, නිපදවන්නේද මිලදී ගන්නේද තීරණය කිරීම තුලින් පිරිවැය අවම කර ගැනීමටත්, සැපයුම්දාමය අඛණ්ඩව පවත්වා ගැනීමටත් .... අවශ්‍ය වේ.

36. අ) බංගලාදේශය, ඉන්දියාව, මියන්මාරය, ශ්‍රී ලංකාව, භූතානය, තායිලන්තය සහ නේපාලය යන රටවල් .... වෙළෙඳ ගිවිසුමට අයත් රටවල්ය.

ආ) ආයතනයක කටයුතු සම්බන්ධීකරණය කිරීමේදී ගැටළු විසඳීමේදී විවිධ දෙපාර්තමේන්තු වැඩ කණ්ඩායම් අතර සමාන මට්ටම් තනතුරු අතර සිදු වන පණිවිඩ හුවමාරුව .... ලෙස හඳුනාගත හැකිය.

37. අ) නැව් ගුවන්යානා නිෂ්පාදනය හා ක්‍රීඩා මණ්ඩප වැනි දෑ ඉදිකිරීමට යෝග්‍ය පිරියත සැලැස්ම .... වන අතර සමස්ථ නිෂ්පාදන ක්‍රියාවලිය එක් කාර්ය ස්ථානයකින් ඊළඟ කාර්ය ස්ථානයට රේඛීයව අනුපිළිවෙලට ගලාගෙන යන ආකාරයට සකස් කළ පිරියත .... ලෙස හඳුන්වයි.

ආ) කොණ්ඩ කැපීම, ඇඳුම් මැසීම වැනි ඒ ඒ ගනුදෙනුකරු අවශ්‍යතා මත ඒ ඒ භාණ්ඩය නිපදවීම .... නිෂ්පාදනය නමින් හැඳින්වේ.

38. අ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සිය සන්නාම .... පනත යටතේ .... ලියාපදිංචි කළ යුතුය.

ආ) මූල්‍ය සැලසුම්කරණ හා පාලන උපකරණ ලෙස .... හා .... යොදා ගනී.

39. අ) රැකියා විශාලනය මඟින් රැකියාවේ කාර්ය කොටස් වැඩි කිරීම සිදුවන අතර එය .... ලෙසත් රැකියා පෝෂණය මඟින් රැකියාවේ බලතල හා වගකීම් වැඩිකිරීම .... ලෙසත් හැඳින්වේ.

ආ) ව්‍යාපාර සංවිධානයන් විධිමත්ව නීත්‍යානුකූලව පවත්වාගෙන යාම සඳහා අපේක්ෂිත සේවාදායකයන්ගේ චර්යාව .... ලෙස හැඳින්වේ.

40. අ) ව්‍යාපාර සැලැස්මක ඇති මෙහෙයුම් සැලැස්මෙහි අඩංගු වන අංග දෙකක් ලෙස .... හා .... සැලකිය හැකිය.

ආ) සංවිධාන ව්‍යුහයක ඉහළ සිට පහළට .... ගමන් කරන අතර පහළ සිට ඉහළට .... ගමන් කරනු ලබයි.

41. වරලත් ගිවිසුම අනුව වරලත්හිමියා විසින් වරලත් ලාභියාට සපයනු ලබන පහසුකම් 04ක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

42. ව්‍යවසායකත්වයේ ප්‍රවනතා 4ක් නම් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

43. විදේශ වෙළෙඳාමට එරෙහි වන තීරු බදු, විනිමය නීති රීති, රේගු නීති වැනි විවිධ බාධා අවම කර ගැනීමට පිහිටුවා ඇති ජාත්‍යන්තර සංවිධාන මොනවාද?

1. ....
2. ....
3. ....
4. ....

44. ව්‍යාපාර අරමුණක තිබිය යුතු ගුණාංග 04ක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

45. මහා පරිමාණ නිෂ්පාදන ආයතනවල මෙහෙයුම් කළමනාකරණ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කර ගැනීමට යොදා ගැනෙන නව නිෂ්පාදන ක්‍රම 04ක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

46. අලෙවිකරණ මිශ්‍රයෙහි විචල්‍යයක් වූ නිෂ්පාදිතය නියෝජනය කරනු ලබන උප විචල්‍යයන් 4ක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

47. මුදල් වෙළඳපල සමන්විත වන වෙළඳපොළවල් 4ක් නම් කරන්න.

....
....
....
....

48. සේවකයෙකුට පත්වීම් ලිපියක ඇති වැදගත්කම දැක්වීමට කරුණු හතරක් දක්වන්න.

1. ....
2. ....
3. ....
4. ....

49. අන්තර්ජාලයට පිවිසීමේදී, භාවිතයේ පුද්ගලයන්ට මෙන්ම ව්‍යාපර ආයතනවලට ද ගැටලු සහ විවිධ අභියෝගවලට මුහුණ පෑමට සිදුවේ. මෙම ගැටලු සහ අභියෝග හතරක් පෙන්වා දෙන්න.

1. ....
2. ....
3. ....
4. ....

50. ව්‍යාපාර සැලැස්මක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු නියමයන් හතරක් දක්වන්න.

1. ....
2. ....
3. ....
4. ....

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

ව්‍යාපාර අධ්‍යයනය - II

32 S II

කාලය: පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

විභාග අංකය: ....

උපදෙස් :-

* ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* **එක්** කොටසකින් අවම වශයෙන් **ප්‍රශ්න දෙක** බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

I කොටස

01. A සහා B යන මිතුරියන් දෙදෙනා එක්ව ඉබ්බාගමුව ප්‍රදේශයේ "AB" යන නමින් රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යන අතර ඔවුන් ඉන්දියාවෙන් ආලේපන වර්ග ගෙන්වා බෙදා හැරීමද සිදු කරයි. බෙදා හැරීමේ වෑන් රථය ණය පහසුකමක් මත මූල්‍ය සමාගමකින් ලබාගෙන ඇත. බෙදා හැරීමේ කටයුතු A අධීක්ෂණය යටතේ වෙනමම කාර්‍ය මණ්ඩලයක් හරහා සිදු වේ. ආයතනය වෙනුවෙන් රක්ෂණවරණයක්ද ලබාගෙන ඇත. රටේ පවතින වර්තමාන තත්වය සමඟ දුෂ්කරතා කිහිපයකටම මුහුණ දීමට සිදු ව ඇති අතර ''C'' යන නාමයෙන් අලුත් රූපලාවන්‍යාගාරයක් ද යාබද ගොඩනැගිල්ලේ ආරම්භ කිරීමට සූදානමක් ඇත.

    i. අ) මෙම සිද්ධිය තුළින් මතු කර කර හැකි නිෂ්පාදිත හතරක් නම් කරන්න. (ල. 02)

    ආ) AB ව්‍යාපාරයේ ඇල්ම දක්වන පාර්ශ්ව 04ක් සිද්ධිය තුළින් හඳුනාගෙන ලියා දක්වන්න. (ල. 02)

    ii. මෙම සිද්ධියට අනුව ''වාණිජ්‍යය'' යන සංකල්පය ගැලීම් සටහනක් මගින් දක්වන්න. (ල. 04)

    iii. රටේ පවතින වර්තමාන තත්වය අනුව AB ව්‍යාපාරයට එල්ල වී ඇති දුෂ්කරතා 02ක් නම් කර ඒවා අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග 02ක් සඳහන් කරන්න. (ල. 04)

    iv. අ) AB ව්‍යාපාරය විසින් පිළිපැදිය යුතු ව්‍යාපාර ආචාරධර්ම 02ක් නම් කරන්න. (ල. 02)

    ආ) මෙම ව්‍යාපාරයට පාරිසරික තිරසර ආරක්ෂණය වෙනුවෙන් ගතහැකි ක්‍රියා මාර්ග 02ක් ලියා දක්වන්න. (ල. 02)

    v. රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීම සඳහා මෙම ව්‍යාපාරයට දායක විය හැකි ආකාර 04ක් නම් කරන්න. (ල. 04)

02. i. අ) රජයේ පිස්කල් ප්‍රතිපත්තිය හා මූල්‍ය ප්‍රතිපත්තිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

    ආ) පාරිභෝගිකයෙකු සතු පාරිභෝගික වගකීම් නම් කරන්න.

    ii. අ) වරලත් ව්‍යාපාරවලින් වරලත්හිමියාට ඇතිවන අවාසි 02ක් සඳහන් කරන්න. (ල. 02)

    ආ) ව්‍යාපාර සංයෝජනය වීමේ දෙයාකාරය දක්වා පැහැදිලි කරන්න. (ල. 02)

    iii. වරලත් ව්‍යාපාර වර්ග 03 දක්වා පැහැදිලි කරන්න. (ල. 04)

    iv. අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට බලපා ඇති හේතු 4ක් සඳහන් කරන්න. (ල. 02)

ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති මූල්‍යමය නොවන දිරි ගැන්වීම් 04 ක් සඳහන් කරන්න. (ල. 02)

v. අ) ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර සම්බන්ධතාව තහවුරු කිරීමට කරුණු හතරක් ඉදිරිපත් කරන්න.

ආ) රටක ව්‍යවසායකයන් බිහිවීම අඩු වීම කෙරෙහි ඉවහල් වන හේතු කවරේද? (ල. 04)

03. i. අ) ආසන්න මුදල් යනු කුමක් දැයි හඳුන්වා ආසන්න මුදල් සඳහා නිදසුන් 02ක් දක්වන්න. (ල. 02)

ආ) මූල්‍ය සමාගමක කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ල. 02)

ii. අ) බලපත්‍රලාභී විශේෂිත බැංකු ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට දායක වන අයුරු කරුණු 04ක් මඟින් දක්වන්න. (ල. 02)

ආ) ශ්‍රී ලංකා මහබැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු අතර වෙනස්කම් 04ක් දක්වන්න.(ල. 02)

iii. අ) ණය ගෙවීමේ හැකියාව ශ්‍රේණිගත කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන 02ක් නම් කරන්න.

ආ) ස්වයංක්‍රීය බැංකු සේවා මඟින් ගනුදෙනුකරුවන්ට අත්වන වාසි 4ක් සඳහන් කරන්න.

iv. කල්ප සිය ව්‍යාපාරික ගොඩනැගිල්ල රු. ලක්ෂ 05 බැගින් A,B,C,D යන රක්ෂණ ආයතන වල රක්ෂණය කර ඔප්පු ලබා ගෙන තිබුණි. හදිසියේම ඇති වූ ගින්නකින් මෙම ගොඩනැගිල්ලට රු. ලක්ෂ 02ක හානියක් සිදුවිය.

අ) කල්පට මෙම ගොඩනැගිල්ලට වන්දි ලෙස ලැබෙන මුදල කොපමණද?

ආ) ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල.02)

v. ''නව කොරෝනා ව්‍යසනයෙන් මුළු ලෝකයම අඩපණ වී සමාජ දුරස්ථභාවයක් පවත්වාගෙන යාමට සිදුවී ඇති වාතාවරණයක් තුළ ''සන්නිවේදනය'' ප්‍රබල මෙවලමක් බවට පත් වී ඇත.''

ඉහත ප්‍රකාශයට ඔබ එකඟවන්නේද? ඔබේ පිළිතුර කරුණු දක්වමින් පැහැදිලි කරන්න. (ල. 02)

04. i. ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති වර්ග නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

ii. අ) සිල්ලර වෙළෙඳාම අර්ථ දක්වන්න.

ආ) සිල්ලර වෙළෙඳාමේ නව ප්‍රවණතා නම් කර පැහැදිලි කරන්න. (ල. 04)

iii. අ) විදේශ වෙළඳාමට පදනම් වී ඇති සාධක නම් කරන්න.

ආ) යුරෝපා සංගමය විසින් gsp + (විශේෂ ප්‍රතිලාභ සහිත වෙළෙඳවරණයක් පිළිබඳ පොදු ක්‍රමය) නැවත ශ්‍රී ලංකාවට පිරිනමා ඇත. මෙය ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට කෙසේ ප්‍රයෝජනවත් වේද? (ල. 04)

iv. අ) ගෝලීය ව්‍යසනය හමුවේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම් දෙකක් පැහැදිලි කරන්න.

ආ) මේ තත්ත්වය හමුවේ දිගින් දිගටම සිදුවන ශ්‍රී ලංකාවේ රුපියලේ අගය අවප්‍රමාණය වීම අඩු කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න. (ල. 04)

iv. අ) විදේශීය වෙළෙඳාමේ දී මුදල් ගෙවීම සඳහා යොදා ගන්නා විද්‍යුත් ගෙවීම් ක්‍රම 04ක් නම් කරන්න. (ල. 02)

ආ) විදේශ වෙළෙඳාමට අදාළව ''ජාත්‍යන්තර සංවිධාන'' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල. 02)

II කොටස

05. i. තීරණ ගැනීමේ තාර්කික ක්‍රියාවලියේ පියවරයන් සඳහන් කර ඉන් පළමු පියවර දෙක කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

ii. අ) සංවිධානකරණය යන්න අර්ථ දක්වන්න. (ල. 02)

ආ) ආයතනයක සාර්ථකත්වය සඳහා සංවිධානකරනයේ වැදගත්කම පැහැදිලි කරන්න (ල. 02)

iii. සේවකයින් අභිප්‍රේරණය කිරීමට මූල්‍යමය මෙන්ම මූල්‍යමය නොවන ක්‍රම යොදාගත හැකි බව සනාථ කරන්න. (ල. 04)

iv. අ) මෙහෙයුම් කළමණාකරනය යන්නෙන් අදහස් කරනුයේ කුමක්ද? (ල. 02)

ආ) මෙහෙයුම් කළමණාකරනයේ මූලික කාර්යය පැහැදිලි කරන්න (ල. 02)

v. කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් සකස්කිරීම සඳහා පිරියත සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි? (ල. 04)

06. i. අ) අලෙවිකරණය පදනම් වී ඇති මූලික සාධක අලෙවිකරණ හර සංකල්ප වේ. අලෙවිකරණ හර සංකල්පයක් වන තරඟකාරිත්වය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල. 02)

ආ) තරඟකාරිත්වයේ මට්ටම් හතර දක්වන්න. (ල. 02)

ii. පහත සඳහන් වන්නේ ව්‍යාපාරිකයන් හතර දෙනෙකු තම නිෂ්පාදිත අලෙවිකර ගැනීම සඳහා දරන ප්‍රයත්නයන්ය.

අ) සුදේශ් පාන් නිෂ්පාදකයෙකු වන අතර ඔහු සාධාරණ මිලකට පාන් නිපදවා අලෙවි කිරීමෙන් තම අලෙවිය වැඩි කිරීමට උත්සාහ දරයි.

ආ) අශේන් ප්‍රදේශයේ පාසල අසල බේකරියක් පවත්වාගෙන යමින්, පාසල් සිසුන්ගේ අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන භාණ්ඩ හා සේවා නිපදවා අලෙවිය වැඩිකර ගැනීමට ප්‍රයත්න දරයි.

ඉ) අශානි මනාලියන් හැඩ ගැන්වීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර, පාරිභෝගික තෘප්තිය මෙන්ම ව්‍යාපාරික අරමුණු කෙරෙහි අවධානය යොමු කරයි. සමාජය, පරිසරය, කෙරෙහිත් සැලකිල්ල යොමු කරමින් කටයුතු කරයි.

ඊ) රශානි ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර එක් එක් අයගේ රුචි අරුචිකම් සලකා බලා ඔවුන් ඉල්ලීම් කරන ආකාරයට විවිධ මෝස්තරවලට මසයි. ඒ මඟින් පාරිභෝගික තෘප්තිය මෙන්ම ලාභයක් ලබා ගැනීමද සිදු කරයි.

ඉහත එක් එක් සිද්ධියට අදාල අලෙවිකරණ සංකල්පය සඳහන් කරන්න.

iii. වෙළඳපල කණ්ඩනය යන්න හඳුන්වා ඒ සඳහා වූ පදනම් හතරක් දක්වා එකිනෙකට නිදසුන බැගින් දක්වන්න. (ල. 04)

iv. අ) අලෙවිකරණ සන්නිවේදන මිශ්‍රයේ ප්‍රධාන ප්‍රවර්ධන උපකරණ 4ක් නම් කරන්න. (ල. 02)

ආ) ආපන ශාලාවක අලෙවි මිශ්‍රය කෙබඳු එකක් විය යුතු දැයි පැහැදිලි කරන්න. (ල. 02)

v. අ) අයවැයකරණයේදී යොදාගන්නා ප්‍රධාන උපකරණ දෙක සඳහන් කරන්න. (ල. 02)

ආ) ව්‍යාපාරයක අභ්‍යන්තර මූල්‍ය සම්පාදක මාර්ග වලින් ලැබිය හැකි වාසි 04ක් දක්වන්න.

07. i. අ) ආයෝජන තීරණ යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල. 02)

ආ) ආයතනයක් අරමුදල් ආයෝජනය කිරීමේදී සලකා බලන කරුණු 04ක් දක්වන්න. (ල. 02)

ii. සපයා ඇති තොරතුරු ඇසුරෙන් පහත සඳහන් එක් එක් අනුපාත ගණනය කරන්න.

	රු.
දළ ලාභය	200000
අවසාන තොගය	40000
ණය ගැතියෝ	20000
විකුණුම්	500000
මුදල් ශේෂය	30000
ණය හිමියෝ	20000
ගෙ/යු/ පොලි	10000
උපචිත විදයම්	4000
කලින් ගෙවූ වියදම්	10000
ඔහු පෙර ශුද්ධ ලාභය	150000
විකුණුම් පිරිවැය	300000
ආරම්භක තොගය	20000

අ) දළ ලාභ අනුපාතය.

ආ) ක්ෂණික අනුපාතය.

ඉ) ශුද්ධ ලාභ අනුපාතය.

ඊ) තොග පිරිවැටුම් අනුපාතය. **(ල. 04)**

iii. ව්‍යාපායක සාර්ථකත්වයට සංවේතන දායක වන්නේ කෙසේ දැයි කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 04)

iv. අ) සේවක චලනය යනු කුමක්දැයි හඳුන්වා එය සිදුකළ හැකි ප්‍රධාන ආකාර දෙකක් නම් කරන්න. (ල. 02)

ආ) අනුස්ථාපනයේ ප්‍රධාන කොටස් දෙක කවරේද? (ල. 02)

v. අනුප්‍රාප්තික සැලැස්ම යනු කුමක්දැයි හඳුන්වා එය සේවක ආකර්ශණය සඳහා දායක කර ගත හැකි ආකාර පෙන්වා දෙන්න. (ල. 02)

08. i. අ) තොරතුරු තාක්‍ෂණයේ වැදගත්කම කරුණු හතරක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 02)

ආ) පරිගණක ජාලයක් යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 02)

ii. අ) තොරතුරු වර්ගීකරණය කළ හැකි ආකාර හතරක් සඳහන් කරන්න. (ල. 02)

ආ) පරිගණක ජීවාංග පද්ධතියක් (Live ware system) යනු කුමක්ද? නිදසුන් ඇසුරින් පෙන්වා දෙන්න.

iii. අ) මෙහෙයුම් මට්ටමේ තොරතුරු පද්ධතිය (Operational Level system) අර්ථකරථනය කොට එමඟින් සිදුකරන ව්‍යාපාරික කටයුතු හතරක් නම් කරන්න.

ආ) තොරතුරු තාක්‍ෂණය විවිධ ක්ෂේත්‍ර කීපයක එකතුවකි. එම ක්ෂේත්‍ර හා තොරතුරු තාක්‍ෂණය සම්බන්ධ වන ආකාරය රූප සටහනකින් පැහැදිලි කරන්න. (ල. 02)

iv. අ) ව්‍යාපාර සැලැස්මක අවසානයේ ඉදිරිපත් කළ යුතු තොරතුරු හතරක් සඳහන් කරන්න. (ල. 02)

ආ) අලෙවිකරණ සැලැස්මක අන්තර්ගත කර්මාන්තය හා වෙළෙඳපොල විශ්ලේෂණය යන්න පැහැදිලි කරන්න.

v. අ) මානව සම්පත් සැලැස්මක අන්තර්ගත විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

ආ) ව්‍යාපාර සැලැස්මක වැදගත් කොටසක් වන මූල්‍ය සැලැස්මේ ඇතුලත් වන ''ව්‍යාපෘති සාරාංශය'' යන්න පැහැදිලි කරන්න.